## චතාරික සමයේ සිව්වන ඉරුදින- 2014-03-30

**තේමාව** : 'අන්ධකාරය ඉවත ලා ආලෝකයට පිවිසෙමු¶

**හැඳින්වීම**

ආලෝකය සහ අන්ධකාරයත්, යහපත සහ අයහපතත් අප ඉදිරියේ ඇත. ආලෝකය උදා වූ විට අන්ධකාරයේ අයහපත් ක්‍රියා පැහැදිලිව පෙනේ. ක්‍රිස්තුන් වහන්සේ ලෝකයේ ආලෝකය වන සේක. එසේනම් අන්ධකාරය වන්නේ පාපයයි. අද දිව්‍ය යාගයේ දේව වචනය පැහැදිලි කරන්නේ අන්ධකාරයේ ගෙවෙන අපගේ ජීවිත පිළිබඳවයි. පාපය තුල නිදා සිටිමින් ආලෝකයට අවදි නොවී ගෙවෙන අපගේ ජීවිත පිළිබඳවයි. එම නිසා පාපයට මන්සථාපී වන්නට, ආලෝකයාණන් වූ කිතු සමිඳාණෝ ළ අවදි වන්නට අවැසි ශුද්ධාත්ම බලය ඉල්ලා මේ දිව්‍ය යාගයට සම්බන්ධ වෙමු.

**ඇතුලුවීමේ ගීය** : කි. බැ.ගී. අංක 51- එළිය ඔබ මගේ

**පළමු කියවීම** : 1 සාමුවෙල් 16 /1, 6-7, 10-13

ඊශ්‍රයෙල්හී රජ ලෙස දාවිත් අභිෂේක කිරීමට දෙවියන් වහන්සේ ඔහුව තෝරා ගත්තේ ඔහුගේ බාහිර පෙනුම අනුව නොව ඇතුාන්ත ජීවිත දෙන බලා බව මේ පාඨය ප්‍රකාශ කරයි.

**මෙනෙහි කිරීමේ ගීය** : දේව වාක්‍ය සංග්‍රහයේ එදිනට නියමිත පිළිතුරු ගිය ගායනා කරන්න.

**දෙවන කියවීම** : එපීසී 5/8-14

ශු. පාවුළුතුමා එදා එපීසී සංසයට දේශනා කරමින්, පාපයේ නිදා සිටින ජනතාවට ක්‍රිස්තුන් වහන්සේ තුළ ආලෝකය දකින්නට ආරාධනා කලාක් මෙන් අද අපගේ අඳුරු ජීවිත වලට ආලෝකය ලබා ගන්නා ලෙස අපටද ආරාධනා කරයි.

**සාදුකාරය** : සමිඳුන් වෙත මගෙ හද යන්නේ.....

"ලෝකයේ ආලෝකය මමයි. මා අනුගාමී වන්නා අඳුරෙහි නොහැසිර ආලෝකය ලබන්නේ යයි ස්වාමීන් වහන්සේ වදාළ සේක.

**ශු. සුවිශේෂය** : ජොහාන් 9/1-41 හෝ 9/1-69, 13-17, 34-38

**විශ්වාසකයින්ගේ යැදුම්** **පිළිතුර** : ස්වාමිනී අපි ඔබට කරන යාච්ඥා අසා වදාල මැනව.

1. ආදර දෙවිපියාණනී, අඳුරේ සිටින ජනතාවට ආලෝකයක් වන්නට වත්මන් ශාන්ත සහා සැලැස්ම තුල ජනතාව යහමග යොමු කරමින් නව දැක්මක් තුළ ගමන් කරන්නට කිතුණු ජනතාව මෙහෙයවන්නට අප සභා නායකයින්ට හැකිවන පිණිස,

2. ආදර දෙවිපියාණනී, දේශය වසාගෙන සිටින පාපී බලවේග දුරුකර දැහැමි මාවතකට යොමු වන්නට සුදුසු පරිසරයක් අප වටා ගොඩ නගා ගැනීමට අප රට නායකයින්ට හැකි වන පිණිස,

3. ආදර දෙවිපියාණනී, මෙම චතාරික සමය මුල්කර ගෙන සමිඳු උත්ථානය සමරන්නට සූදානම් වන කිතුණු ජනතාව වන අප ගමන් ගන්නාවූ පාපි බලවේග වලින් මිදී තම ජීවිත ගොඩනගා ගන්නට හැකිවන පිණිස,

4. ආදර දෙවිපියාණනී, පාපය නැමති අන්ධකාරයෙන් වැසී තිබෙන අපගේ ජීවිත සැබෑ පසුතැවිල්ලක් තුලින් ආලෝක කර ගැනීමට අවැසි ශුද්ධාත්ම මඟ පෙන්වීම ලැබෙන පිණිස,

**පඬුරු පිදීමේ ගීය** : කි.බැ.ගී. අංක 124- පවට නැමුණු අප වෙත

**බොජුන් ගීය** : කි.බැ.ගී. අංක 367- ආලෝකයේ දරුවෝ

**අවසාන ගීය** : කි.බැ.ගී. අංක 271- සාමයේ ජීවත මග

# චතාරික සමයේ සිව්වන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය 1 සාමුවෙල් 16: 1, 5බී–7, 10–13

*සාමුවෙල්ගේ පළමුවන පොතෙන් උපටා ගත් කොටසකි.*

### දාවිත් ඉශ්රායෙල් රජු වශයෙන් ආලේප කරනු ලබයි.

සමිඳාණන් වහන්සේ සාමුවෙල්ට කතා කොට, “නුඹ කොපමණ කල් සාවුල් ගැන ශෝක වන්නෙහි ද, මම ඔහු ඉශ්රායෙල්වරුන් කෙරෙහි රජකම් කිරීමෙන් පහ කෙළෙමි. දැන් නුඹ තෙල් කුළාව පුරවාගෙන බෙත්ලෙහෙම් හි සිටින ජෙස්සේ නම් තැනැත්තා වෙත යන්න. මන්ද, ඔහුගේ පුත්‍රයන් අතරෙන් රජෙකු මම තෝරා ගත්තෙමි”යි වදාළ සේක.

ස්වාමින් වහන්සේ වදාළ පරිදි සාමුවෙල් ජෙස්සේද ඔහුගේ පුත්‍රයන් ද පවිත්‍ර කොට පූජාවට කැඳවිවේ ය. ඔවුන් පැමිණි කල සාමුවෙල් එලියාබ් දෙස බලා, “සැබැවින් ම සමිඳාණන් වහන්සේගේ අභිෂේක ලත් තැනැත්තේ උන් වහන්සේ ඉදිරියෙහි සිටී” යි තමන්ට ම කියා ගත්තේ ය. එහෙත්, සමිඳාණන් වහන්සේ සාමුවෙල්ට කතා කොට, “ඔහුගේ පෙනීම දෙස වත්, ශරීරයේ උස මහත දෙස වත් නොබලන්න: මන්ද, මම ඔහු ප්‍රතික්ෂේප කෙළෙමි. සමිඳාණන් වහන්සේ මිනිසා බලන්නාක් මෙන් නොබලන සේක. මිනිසා බලන්නේ බාහිර පෙනීම දෙස ය. එහෙත්, සමිඳාණන් වහන්සේ බලන්නේ සිත දෙස ය” යි වදාළ සේක.

මෙසේ ජෙස්සේ තමාගේ පුත්‍රයන්ගෙන් සත් දෙනෙකු සාමුවෙල් ඉදිරිපිටට එන්නට සැලැස්සුවේ ය.

සාමුවෙල් ද, “මොවුන් එක්කෙනෙකු වත් සමිඳාණන් වහන්සේ තෝරා නොගත් සේකැ” යි ජෙස්සේට කී ය.

එසේ කියා සාමුවෙල්, “ඔබේ පුත්‍රයෝ හැමදෙනා ම මෙහි සිටිත් දැ” යි ජෙස්සේගෙන් ඇසී ය.

ජෙස්සේ පිළිතුරු දෙමින්, "තව ඉතිරි ව සිටින්නේ බාලයා ය: ඔහු බැටළුවන් බලාගෙන සිටිනවා ය"යි කී ය. සාමුවෙල් ද, "පණිවුඩකාරයකු යවා ඔහු මෙහි ගෙන්වන්න. ඔහු මෙහි එන තුරු අපි පූජාව ඔප්පු නොකරන්නෙමු"යි ජෙස්සේ ට කී ය. එවිට ජෙස්සේ පණිවුඩකාරයකු යවා ඔහු ගෙන් වී ය. ඔහු රතු පැහැයක් ද කඩවසම් පෙනුමක් ද දීප්තිමත් නෙත් යුවළක් ද ඇති කෙනෙකි, සමිඳාණන් වහන්සේ කතා කරමින්, "නැගිට මොහු අභිෂේක කරන්න: මොහු ඒ තැනැත්තා ය"යි වදාළ සේක. එවිට සාමුවෙල් තෙල් කුළාව රැගෙන ඒ තැනැත්තා ඔහුගේ සහෝදරයන් ඉදිරියෙහි අභිෂේක කළේ ය. එදින පටන් සමිඳාණන් වහන්සේගේ ආත්මානුභාවය දාවිත් කෙරෙහි පිහිටිණි. සාමුවෙල් නැගිට ආපසු රාමා නගරයට ගියේ ය.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය — ගීතාවලිය 23: 1–6

**පිළිතුර:** සමිඳාණෝ මා එඬේරාණෝ ය. මට හිඟයක් නොවන්නේ ය.

**ගීය:** සමිඳාණෝ මා එඬේරාණෝ ය, අඟ හිඟ මට නොවන්නේ ය.
එතුමාණෝ තිල් තණ බිම් මත මා සතප්වා,
නිසල දියවෙත පමුණුවා, මා පණගන්වන සේක.
සිය නාමයේ මහිමය සැලසෙන ලෙස දමිටු මඟ මා ගෙන යන සේක.

මරණය වැනි ගන'දුරු රුදුරු නිම්නය මැදින් ගියත්,
ඔබ මා සමඟ බැවින්, මට කිසි බියක් නොවන්නේ ය.
ඔබේ කෙවිට ද සැරයටිය ද මා නියත සැනසිල්ල වන්නේ ය.

ඔබ මාගේ සතුරන් ඉදිරියේ දී, මංගල බොජුනක් පිළියෙළ කර දී
මා සිරස තෙලින් ආලේප කරන සේක. මාගේ කුසලාන උතුරා යන්නේ ය.
ඔබේ දයාව හා කරුණාව නියත ව, දිවි හිමියෙන් මා අනුව එන්නේ ය.
සමිඳුන්ගේ නිවාසය මාගේ සදාතන වාසය වන්නේ ය.

## දෙවන දේව ප්‍රකාශනය එපේසි 5: 8-14

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් එපේසිවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

මරණින් නැගිටින්න. ක්‍රිස්තුස් වහන්සේ ඔබේ ආලෝකය වන සේක.

වරක් ඔබ අන්ධකාරයෙහි හිටිය නමුත්, දැන් සමිඳාණන් වහන්සේ තුළ ආලෝකයෙහි සිටින්නහු ය. ආලෝකයට අයිති දරුවන් මෙන් හැසිරෙන්න. ආලෝකයේ ප්‍රතිඵල නම්, සියලු ආකාර යහපත්කමත්, දමිටු කමත්, සැබෑ කමත් ය. සමිඳාණන් වහන්සේට ප්‍රිය මනාප දේ කුමක් දැ යි විමසා බලන්න. අන්ධකාරයේ නිෂ්ඵල ක්‍රියාවලට හවුල් නොවී, ඒවා එළිකරන්න. සැබැවින් ම ඔවුන් රහසිගත ව කරන දේ ගැන කතා කිරීම පවා පිළිකුලකි. එහෙත් ආලෝකයෙන් එළි වන සියල්ලේ නියම ස්වභාවය සක්සුදක් සේ පැහැදිලි ව පෙනෙයි. එසේ එළි වන දේ ආලෝකය බවට හැරේ. එබැවින් මෙසේ කියා ඇත: "නිදා සිටින ඔබ අවදි වන්න, මරණින් නැගිටින්න, එවිට ක්‍රිස්තුන් වහන්සේ ඔබගේ ආලෝකය වන සේක."

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද යොහන් 8: 12

"ලෝකයේ ආලෝකය මම ය:
මා අනුගමනය කරන්නා අඳුරෙහි නොහැසිර
ජීවනයේ ආලෝකය ලබන්නේ ය" යි
ස්වාමින් වහන්සේ වදාළ සේක.

## සුවිශේෂය ජොහන් 9: 1–41 හෝ 9: 1, 6–9, 13–17, 34–38

*සුවිශේෂක ජොහන් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"ජේසුස් නම් කෙනෙක් මට ඇස් පෙනීම ලබා දුන්නේ ය."

උන් වහන්සේ වඩිනා කල්හි, උපන් දා සිට අන්ධ වූ මිනිසෙකු දුටු සේක.

("ගුරුදේවයෙනි, මොහු අන්ධ ව ඉපදුණේ මොහු හෝ මොහුගේ දෙමවුපියන් හෝ පව් කළ නිසා දැ"යි ශ්‍රාවකයෝ උන් වහන්සේගෙන් ඇසූ හ. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "මොහු අන්ධ ව ඉපදුණේ මොහු වත් මොහුගේ දෙමවුපියන් වත් පව් කළ නිසා නොව: දෙවියන් වහන්සේගේ බලය මොහු තුළ ප්‍රකාශ වන පිණිස ය. දිවා කාලය තිබෙන තුරු මා එවා වදාළ තැනැන් වහන්සේගේ ක්‍රියා අප විසින් කළ යුතු ය. රාත්‍රි කාලය පැමිණෙයි: එවිට කිසිවෙකුට ක්‍රියා කළ නොහැකි ය. මම ලෝකයෙහි සිටින තුරු ලෝකයේ ආලෝකය වෙමි"යි වදාළ සේක.)

මෙසේ කියමින් උන් වහන්සේ බිමට කෙළ පිඩක් ගසා, එයින් මඩ සාදා, ඔහුගේ නෙත්වල ගල්වා, "ගොස් සිලෝවම් පොකුණෙන් සෝදා ගන්නැ"යි වදාළ සේක. (සිලෝවම් යන්නෙහි අර්ථය 'එවන ලද්දේ ය' යනු යි.) එවිට ඔහු ගොස් සෝදාගෙන පෙනීම ලැබ ආපසු පැමිණියේ ය.

අසල්වාසීහු ද, පෙර ඔහු සිඟනු දුටු අය ද, "මේ අර හිඳගෙන සිඟා කෑ මිනිසා නොවේ දැ"යි ඇසූහ. "මේ ඔහුම ය"යි සමහරු කී හ. "නැත, ඔහු නොවේ, ඔහුට සමාන අන් අයෙකැ"යි වෙනත් අය, කී හ. එහෙත්, "මම ඒ මිනිසා ම ය"යි ඔහු කී ය.

("එසේ නම් තුඹේ ඇස් පෑදුණේ කෙසේ දැ"යි ඔව්හු ඔහුගෙන් ඇසූහ. ඔහු පිළිතුරු දෙමින්, "ජේසුස් නම් කෙනෙක් මඩ සාදා මගේ ඇස්වල ගල්වා, 'සිලෝවම් පොකුණට ගොස් සෝදාගන්නැ'යි මට කී හ. මම ගොස් සෝදාගෙන පෙනීම ලබාගතිමි"යි කී ය. "ඒ තැනැත්තා කොහේ දැ"යි ඔව්හු ඇසූ හ. "මම නො දනිමි" යි ඔහු කී ය.) ඔව්හු කලින් අන්ධ ව සිටි ඒ තැනැත්තා පරිසිවරුන් වෙතට ගෙන ගියහ. ජේසුස් වහන්සේ මඩ පිඩක් සාදා ඔහුගේ ඇස් පෑදුවේ සබත් දවසක දී ය. එබැවින් ඔහුට පෙනීම ලැබුණේ කොහොම දැ යි නැවතත් පරිසිවරු ඔහුගෙන් ඇසූ හ. ඔහු පිළිතුරු දෙමින්, "උන් වහන්සේ මාගේ ඇස්වල මඩ ගැල්වූ සේක: මම සෝදාගතිම: එවිට පෙනීම ලදිමි"යි කී ය.

එබැවින් පරිසිවරුන්ගෙන් සමහරෙක්, “ඒ මිනිසා සබත් විනය කඩ කරන බැවින් ඔහු දෙවියන් වහන්සේ වෙතින් පැමිණියෙක් නොවේ ය”යි කී හ. එහෙත් අන් සමහරෙක්, “පව්කාර මිනිසෙකුට මෙබඳු හාස්කම් කළ හැක්කේ කෙසේ දැ”යි ඇසූහ. මෙසේ ඔවුන් අතර භේදයක් ඇති විය. එබැවින් ඔව්හු නැවතත් අන්ධයාට කතා කොට, “නුඹේ ඇස් පෑදුවේ ඒ මිනිසා නම්, ඔහු ගැන නුඹේ අදහස කුමක් දැ”යි ඇසූ හ. “ඔහු නම් දිවැසිවරයෙකැ”යි හෙතෙම පිළිතුරු දුන්නේ ය.

(ඔහු අන්ධ ව සිටි බවත්, පසුව පෙනීම ලැබූ බවත්, පෙනීම ලැබූ මිනිසාගේ දෙමවුපියන් කැඳවා විමසන තුරු විශ්වාස කිරීමට ජුදෙව්වරු මැළි වූ හ. “මේ මිනිසා ඔබේ පුතා ද? ඇත්තට ම ඔහු අන්ධ ව උපන්නේ ද? එසේ නම් දැන් ඔහුට පෙනෙන්නේ කෙසේ දැ”යි ඔව්හු දෙමවුපියන්ගෙන් ප්‍රශ්න කළහ. ඔහුගේ මවුපියෝ පිළිතුරු දෙමින්, “මේ අපගේ පුත්‍රයා බව අපි දනිමු, ඔහු අන්ධ ව උපන් බවත් අපි දනිමු. එහෙත් දැන් ඔහුට පෙනෙන්නේ කොහොම දැ යි අපි නොදනිමු. ඔහුගේ ඇස් පෑදුවේ කවරෙක් ද කියාත් අපි නොදනිමු. ඔහුගෙන් ම අසන්න: දැන් ඔහු තේරෙන වයසැති කෙනෙකි. තමා ගැන ම කතා කරන්නට ඔහුට පුළුවනැ” යි කී හ.

ඔහුගේ දෙමවුපියන් මෙසේ කීවේ ජුදෙව්වරුන්ට බියෙනි. මන්ද, ‘යමෙක් උන් වහන්සේ ක්‍රිස්තුවරයාණෝ යයි ඒත්තුගන්නේ නම් ඔහු ධර්මශාලාවෙන් නෙරපාදැමිය යුතු ය’යි ජුදෙව්වරුන් නියම කරගෙන සිටි හෙයිනි. ඒ නිසා ඔහුගේ මවුපියෝ, “ඔහු තේරෙන වයසැති කෙනෙකි: ඔහුගෙන් අසන්නැ”යි කී හ.

ඔව්හු අන්ධ ව සිටි මිනිසා නැවතත් ගෙන්වා, “දෙවියන් වහන්සේ ඉදිරියේ ඇත්ත කියන්න: මේ මිනිසා නම් පව්කාරයෙකු බව අපි දනිමු” යයි කී හ. එවිට ඔහු පිළිතුරු දෙමින් “ඒ තැනැත්තා පව්කාරයෙක් ද නැද්දැ යි මම නොදනිමි: එහෙත් එක දෙයක් මම දනිමි: මම අන්ධ ව සිටියෙමි, දැන් මට පෙනේ” යයි කී ය. එවිට ඔව්හු, “ඔහු ඔබට කුමක් කෙළේ ද? ඔබේ ඇස් පැහැදුවේ කොහොම දැ”යි ඔහුගෙන් ඇසූ හ. ඔහු පිළිතුරු දෙමින්, “මම කලින් ඔබට කීවෙමි, එහෙත් ඔබ මගේ කීම ඇසුවේ නැත. ඔබ එය නැවතත් අසන්නට තැත් කරන්නේ මන් ද? ඔබත් උන් වහන්සේගේ ශ්‍රාවකයන් වෙන්නට අදහස් කරන නිසා වත් දැ”යි ඇසී ය.

ඔව්හු ඔහුට බැණවදිමින්, “ඔබ යි ඔහුගේ ශ්‍රාවකයා: අපි නම් මෝසෙස්ගේ ශ්‍රාවකයෝ වම්හ. දෙවියන් වහන්සේ මෝසෙස්ට කතා කළ බව අපි දනිමු. එහෙත්

මේ මිනිසා ගැන නම්, මොහු කොහෙන් වී දැ යි අපි නොදනිමු”යි කී හ.

ඒ මිනිසා පිළිතුරු දෙමින්, “මෙය මහ පුදුමයක්! ඔහු කොතැනින් ආවේදැ යි ඔබ නොදන්නාහු යː එහෙත් මාගේ ඇස් පෑදුවේ ඔහුය. දෙවියන් වහන්සේ පව්කාරයන්ගේ බස් නොඅසන බවත්, දේව භක්තිය ඇති, දේව කැමැත්ත කරන, යමෙකු ඇත්නම් ඔහුගේ බස් අසන බවත් අපි දනිමු. යම් කිසිවෙකු අන්ධ ව උපන් කෙනෙකුගේ ඇස් පෑදූ බව ලෝකයේ පටන්ගැන්මේ සිට කවදාවත් ඇසූ දෙයක් නොවේ. මේ තැනැත්තා දෙවියන් වහන්සේ වෙතින් නොපැමිණියෙක් නම් කිසිවක් කරන්නට ඔහුට නොහැකි ය”යි කී ය.)

ඔව්හු පිළිතුරු දෙමින්, “උපත් දා සිට ම පාපයේ සිටින ඔබ අපට උගන්වන්නට එන්නෙහිදැ” යි කියා ඔහු ධර්මශාලාවෙන් නෙරපා දැමූ හ.

ඔවුන් ඒ මිනිසා නෙරපා දැමූ බව ජේසුස් වහන්සේට ආරංචි වී, ඔහු හමු වූ පසු, “ඔබ මනුෂ්‍ය-පුත්‍රයාණන් අදහන්නෙහි දැ”යි ඇසූ සේක. “ස්වාමිනි, ඒ කවරෙක් ද? එතුමා අදහාගන්න පිණිස මට කියන්නැ” යි ඔහු යැදී ය. “ඔබ එතුමා දැක ඇතː දැන් ඔබ සමඟ කතා කරන තැනැත්තේ එතුමා ය”යි පිළිතුරු දුන් සේක. ඔහු ද, “ස්වාමිනි, මම අදහමි”යි කියා පසඟ පිහිටුවා උන් වහන්සේට වැන්දේ ය.

ජේසුස් වහන්සේ කතා කොටː “මා මෙලොවට වැඩියේ විනිශ්චය සඳහා ය. එයින්, පෙනීම නැත්තන්ට පෙනීම ඇති වනු ඇත. පෙනීම ඇත්තන්ට පෙනීම නැති වනු ඇතැ” යි වදාළ සේක.

උන් වහන්සේ සමඟ සිටි පරුසිවරුන්ගෙන් ඇතැමෙක් එය අසා, “අපිත් අන්ධයෝ දැ?”යි උන් වහන්සේගෙන් ඇසූ හ. උන් වහන්සේ පිළිතුරු දෙමින්, “ඔබ අන්ධව සිටියා නම් ඔබට පාපයක් නැත. එහෙත් දැන් ‘අපට පෙනේ ය’යි ඔබ කියන නිසා ඔබේ පාපය එසේ ම පවතී ය”යි ඔවුන්ට වදාළ සේක.

*සම්දාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*

*(වරහන් අතර කොටස් අත් හළ හැකිය.)*




# “අපිත් අන්ධයෝ ද?”

*චතාරික සමයේ සතරවන ඉරුදින - 26-03-2017*

## හැඳින්වීම

මේ මොහොතේ ඔබ මෙය කියවන බැවින් ඔබ කිසිසේත් ම අන්ධයෙකු විය නොහැක. එහෙත් ඔබට පෙනෙන දේ ඔබ නිවැරදිව දකිනවාද? අප හැම කෙනෙකුට ම ලෝකය පිළිබඳව අපට ම ආවේණික වූ දැක්මක් ඇත. අප අනිත් අය දෙසත්, ජීවිත සිද්ධීන් දෙසත් බලන්නේ මේ දැක්ම තුළ හිඳිමිනි. මේ දැක්ම කෙතරම් දුරට නිවැරදි ද? අපේ දැක්ම දෙවියන් වහන්සේගේ දැක්ම සමග සමාන කළ හැකිද? දෙවියන් වහන්සේ ලෝකය දෙස බලන ආකාරයට බලන්නට අපට හැකිද? ශාරීරික ඇස් වලට හොඳින් පෙනුණත්, අපේ ආත්මික ඇස් අන්ධ වෙලා විය නොහැකිද? ජේසුන් වහන්සේ මෙන් ආදරය කරන්නට, සමාව දෙන්නට, බිය නොවන්නට අපට නොහැකි වී ඇත්තේ ඒ නිසා විය නොහැකිද?

## දේව වචනය

කලින් සතියක දී සඳහන් කළ ආකාරයට චතාරික සමයේ පළමු කියවීම යොදා ගැනෙන්නේ ගැළවීමේ ඉතිහාසයේ සංධිස්ථානයන් සිහිපත් කරවීමටයි. ඒ අනුව අද පළමු කියවීමෙන් ඊශ්‍රායලයේ රජු වීමට දාවිත්ව ආලේප කිරීමේ සිද්ධිය අපට ඉදිරිපත් කෙරේ. මේ අනුව දාවිත්ව තෝරා ගැනීමත්, ඔහුගේ කාලයේ දී ඊශ්‍රායෙල් රාජ්‍යයේ ඇතිවන ස්ථාවරභාවයත් දේව මැදිහත්වීමකින් සිදුවූ බව අපට පෙන්වා දෙයි. මෙම තෝරාගැනීමේ දී ශක්තිමත්, හොඳ පෙනුමක් ඇති වැඩිමහල් සහෝදරයා වෙනුවට එතරම් සුදුසුකමක් නැතැයි මෙන් පෙනෙන බාල සහෝදරයාව ආලේප කරනු ලැබෙයි. මෙය පසුකාලයක දී බලසම්පන්න, දේශපාලනික ගැළවුම්කාරයෙකු ගැන ජනතාව අතර උපදින අනිසි බලාපොරොත්තුව පිළිබඳව පෙර නිමිත්තක් ලෙස පෙනෙයි.

1 සාමුවෙල් 16:1, 5බී - 7, 10 - 13

ගීතාවලිය 23:1-6

එපේසි 5:8-14

ජුවාම් 9:1-41

ජුවාම් සුවිශේෂයේ සඳහන් වන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රාතිහාර්යයන් අතරින් හතක් පමණි. එතුමා ඒවා හඳුන්වන්නේ 'සළකුණු' ලෙසිනි. අද අප සවන් දෙන්නේ උපන් දා සිට අන්ධ වූ මිනිසෙකුව සුව කිරීම පිළිබඳ ප්‍රාතිහාර්යයටයි. සිද්ධිය රෝගියා සුවවන තැනින් නතර නොවී ජේසුන් වහන්සේට විරුද්ධව සිදුවන කුමන්ත්‍රණයක් දක්වා ඇදී යයි. ජුවාම් තුමා මේ සම්පූර්ණ සිද්ධි දාමයට යටින් අවධාරණය කරන්නට උත්සහ කරන තේමාව නම් 'අන්ධකාරයෙන් පිරුණු ලෝකයට පැමිණි ආලෝකය නම් ක්‍රිස්තුන් වහන්සේ බව'යි. එමෙන්ම එතුමා මෙය ප්‍රසාද ස්නාපනයට සම්බන්ධතාවයක් ඇති බව පෙන්නුම් කරයි. විශේෂයෙන්, සුවය දානය කිරීමට ක්‍රිස්තුන් වහන්සේ යොදා ගන්නා ක්‍රමය - එනම් සිලෝවම්



පොකුණෙන් ස්නානය කරන්නට කීම - මේ බව වඩාත් තහවුරු කරයි.

දෙවන කියවීමේ පාවුලු තුමාගේ වචන සුවිශේෂයේ ජුවාම් තුමාගේ තේමාව සමග හොඳින් ගැලපේ. පාවුලු තුමාද ලෝකයේ අන්ධකාරය සහ ක්‍රිස්තුන් වහන්සේ තුළින් පැමිණෙන ආලෝකය ගැන සඳහන් කරයි. ක්‍රිස්තුන් වහන්සේ නැමති ආලෝකය තුළට පැමිණෙන ලෙස එතුමා අවවාද කරයි.

## මෙනෙහි කිරීම

මගේ ළමා ලෝකයේ වීරයා රොබින් හුඩ් විය. තරුණ කාලයේ තවත් විවිධ චරිත ඒ තැන ගත් නමුදු දැන් මගේ වීරයින් වී සිටින්නේ සාන්තුවරයන් සහ සාන්තුවරියන් ය. ඇයි ඔවුන්ව මට වීරයින් ලෙස පෙනෙන්නෙ? මට ප්‍රශ්නයක්, සිත් වේදනාවක් පැමිණි විගස මම කරන්නේ ඒ හා සමාන අවස්ථාවකට මුහුණ දුන් සාන්තුවරයෙක් හෝ සාන්තුවරියක් ඇත්දැයි විපරම් කර බැලීමයි. නිල වශයෙන් පිළිගත් ශුද්ධවන්තයින් පමණක් දස දහසක් ඉක්මවා සිටින කතෝලික සභා ඉතිහාසය තුළ එවැනි එක් අයෙක්ව හෝ සොයා ගැනීමට අපහසු නැත. ඉන්පසු මා කරන්නේ ඔහු හෝ ඇය එම ප්‍රශ්නයට මුහුණ දුන් ආකාරය විමසා බැලීමයි. ඔවුන්ගේ පිළිතුරු හා ක්‍රමය සැබවින් ම පුදුමාකාරය. බොහෝ වෙලාවට එය මා කරන්නට සිතාගෙන සිටි දෙයට වඩා වෙනස් ය. **ඔවුන් ජීවිතය දෙසත්, තමන් වටේ සිටින අය දෙසත් බලන්නේ අමුතු ම ආකාරයකට යැයි මට සිතේ. ඔවුන්ගේ ජීවිතය විප්ලවීය විශ්වාසයක් මත පදනම් වූ නිහඬ විප්ලවයක් වැනිය. මට ඔවුන් වීරයින් වන්නේ ඒ නිසාය.**



කොහොමද මේ වෙනස ඇතිවෙන්නෙ? ඇයි ඔවුන්ට අපට වඩා වෙනස් විදිහකට පෙනෙන්නෙ? අධ්‍යාත්මික ජීවිතයේ ගැඹුරට ගමන් කළ අයට මේ ලෝකයේ දේවල් දෙස වුවද දෙවියන් වහන්සේ බලන විදිහට බලන්නට හැකියාව ලැබේ. දෙවියන් වහන්සේ දකින විදිහ අප දකින ආකාරයට වඩා බොහෝ වෙනස් ය. අද පළමු කියවීම මීට සාක්ෂි දරයි. ජෙස්සේගේ පුත්‍රයෙක්ව රජකමට ආලේප කරන්නැයි දෙවියන් වහන්සේ පැවසූ විට සාමුවෙල් බැලුවේ ඔවුන්ගේ පෙනුම, කාය ශක්තිය හා දැනුම ආදිය දෙසය. දිවැසිවරයෙකු වූ සාමුවෙල් බැලුවේත් එලෙස නම් අපේ තත්වය කෙබඳු විය හැකිද? රජකමට කෙනෙක් තෝරන්නැයි අපට පැවසුවේ නම් අපත් කරන්නේ මෙය ම නොවේද? සෑම මැතිවරණයක දීමත් අප ක්‍රියා කරන්නේ මෙලෙස නොවේද? දුවට හෝ පුතාට සහකරුවෙක් / සහකාරියක් සොයද්දී බලන්නේ මෙවැනි බාහිර දේ දෙස නොවේද? *"සමිඳාණන් වහන්සේ මිනිසා බලන්නාක් මෙන් නොබලන සේක. මිනිසා බලන්නේ බාහිර පෙනුම දෙස ය. එහෙත් සමිඳාණන් වහන්සේ බලන්නේ සිත දෙස ය."* අපට බොහෝ දේ පෙනෙන නමුත් නොපෙනෙන ප්‍රමාණයකුත් තිබෙන බව මින් අදහස් වනවා නොවේද? කිසියම් කෙනෙක් හෝ දෙයක් ගැන ඔබ සිතා සිටි ආකාරය පසු කාලයක දී විශේෂ හේතුවක් නැතුව වෙනස් වූ බවක් ඔබ අත්දැක තිබේද? අපි ඇසට පෙනෙන දේ පිළිගනිමු. මනසට වැටහෙන දේත් පිළිගනිමු. එහෙත් ආත්මයට ගෝචර වන දේ පිළිනොගනිමු. මන්ද අපේ ආත්මය අන්ධය.

**අධ්‍යාත්මික අන්ධබව කිතුනුවන් අතර බහුලව පැතිරී ඇති රෝගයකි. ශාරීරික අන්ධබවට වඩා මෙය ඉතා බරපතල ය. විනාශකාරී ය. අද වන විට අප අතරත් අනාගමිකයන් අතරත් වෙනසක් නැති වීමට ප්‍රධාන හේතුව මෙය වේ.** අප අපේ කිතුනු අනන්‍යතාවය රැක ගැනීමට උත්සහ කරන්නේ චාරිත්‍ර වාරිත්‍ර තුළිනි. එහෙත් යම් අසාධාරණයක්, අපහාසයක්, පාඩුවක් සිදුවූ විට අප ප්‍රතිචාර දක්වන්නේත් අනාගමිකයන් කරන අකාරයටම ය. අද සුවිශේෂය අපට තරවටුවකි. උපන්දා සිට අන්ධව සිටි පුද්ගලයා ජේසුන් වහන්සේගෙන් ලබා ගත්තේ ශාරීරික සුවය පමණක් නොවන බව කතාන්දරයේ අවසානයට ළඟා වන විට අපට පෙනී යයි. ඔහු උන්වහන්සේ මෙසියස් වහන්සේ බව පිළිගෙන උන්වහන්සේට නමස්කාර කිරීමටත් පටන් ගත්තේය. අපට දෙවියන් වහන්සේගෙන් කෙතරම් දේ ලැබී ඇත්ද? අපේ ජීවිත වල සිදුවී ඇති ප්‍රාතිහාර්යයන් කොතෙක්ද? එහෙත් ඒවා ප්‍රාතිහාර්යයන් ලෙස දකින්නට අපට නොහැකි ඇයි? කෙනෙක් ඔබට රිදවන විට ඔහුගේ/ඇයගේ නපුරුකම

දකිනවා මිස ඊට යටින් ඇති තුවාල දැකිය නොහැක්කේ ඇයි? අපට සමහර තැන් නොපෙනෙන නිසා නේද?

නැත. අපි කිසිදාක එලෙස නොකියමු. අපට නොපෙනේ යැයි අපි කිසි දවසක පිළි නොගනිමු. 'ආගම ගැන, කිතුනු විශ්වාසය ගැන, හරි වැරැද්ද තෝරා ගැනීම ගැන අපට කිසිවෙකුගෙන් කිසිවක් ඉගෙන ගැනීමට ඉතුරු වී නැත. අපි හැම ඉරිදාම නොවරදවා පූජාවට යන බැතිමත් කතෝලිකයින් වෙමු.' මේ පරිසිවරුන්ගේ සිතුවිලි ය.

"ඔබ අන්ධව සිටියා නම් ඔබට පාපයක් නැත. එහෙත් දැන් අපට පෙනේය, යි ඔබ කියන නිසා ඔබේ පාපය එසේම පවතී යැ"යි ක්‍රිස්තුන් වහන්සේ අද අපට පවසන සේක. **අපට පෙනෙයි. එහෙත් අපි දකින්නට අසමත් වී සිටිමු. අපට ඇසෙයි. එහෙත් අපි ඇහුම්කන් දෙන්නට අසමත් වී සිටිමු. අපි කතා කරමු. එහෙත් නොවටිනා දේ ගැන මිස වැදගත් දේ ගැන කතා නොකරමු.**

අප ජීවත් වන්නේ විවිධ ඝෝෂාවන් සහ ක්‍රියාකාරකම් වලින් පිරුණු ලෝකයක ය. එමනිසා නොදැනුවත්ව ම අපි නිෂ්ඵල දේ අසන්නටත්, දකින්නටත්, කතා කරන්නටත් පෙළඹෙන්නෙමු. සමහර විට මේවා බාහිරින් පැමිණෙන ඝෝෂාවන් (රූපවාහිනිය, සංගීතය, පුවත් පත්, දුරකතන ඇමතුම් ආදිය) විය හැකි අතර තවත් විටෙක අපේ ම ඇතුළාන්තයෙන් පැන නගින ඒවා (අපේ ආශාවන්, බය නොසන්සුන්කම වැනි දේ) විය හැක. අපි හොඳ දේ දකිමු නම්, අසමු නම්, කතා කරමු නම් අපට හොඳ පුද්ගලයෙකු වීමට පහසු ය. එහෙත් අප බලන්නේ බොළඳ ටෙලිනාට්‍ය, පුහු චිත්‍රපට, නොමේරු දේශපාලන සංවාද නම්, අප අසන්නේ ඕපා දූප සහ කේලාම් නම්, අප කතා කරන්නේ අනුන්ගේ වැරදි සහ පැමිණිලි කිරීම පමණක් නම් දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය තුළ ජීවත් වීම දුෂ්කර වේ.



මොහොතකට සිතා බලන්න. නිගමන වලට එළඹීමට අප කෙතරම් ඉක්මන්ද? දවස පුරා අප කී දෙනෙක්ව අපේ ම සිත තුළ විනිශ්චයට ලක් කරනවාද? අප අපේ අත්දැකීම්, සංස්කෘතිය, සම්ප්‍රදායන් සහ ජීවිත පිළිවෙත මත පදනම් ව කොපමණ දේවල් ගැන තීන්දු දෙනවාද? දෙදෙනෙකු සාමාන්‍යයෙන් හමු නොවන තැනක දී කතා කරමින් සිටිනවා දුටුවොත් අප මොනවාද සිතන්නේ? අප නුසුදුසු යැයි සිතන ආකාරයේ ඇඳුමකින් හෝ විලාසිතාවකින් සැරසී පැමිණෙන කෙනෙක් ගැන සිතන්නේ කොහොමද? "එයා ඔය කතාව කිව්වෙ මට ඇනෙන්නම යි" "මම දන්නවා එයා එහෙම කෙරුවෙ ඇයි කියලා" "ඒ වුනාට එයාට මෙහෙම කරන්න තිබුණනෙ" "ඇයි එහෙනම් එයාට මෙහෙම කරන්න බැරි වුණේ?" .... අපි කතා කරන්නේ හැම දෙයක් ගැනම සියයට සියයක් ම නිවැරදිව අප දන්නවායැයි සිතාගෙනය. යම් පුද්ගලයෙකුගේ අපට මතුපිටින් පෙනෙන හැසිරීමට යටින් ඒ සඳහා තුඩු දිය හැකි හේතු මොනතරම් තිබෙන්නට පුළුවන්ද? අපට නොතේරෙන, නොපෙනෙන දේවල් කොපමණ තිබෙන්නට පුළුවන්ද? එහෙත් අපි සියල්ල දත් යැයි සිතාගෙන විනිශ්චය කර, තීන්දු දී ඒවා අනිත් අයටත් දැනුම් දෙන්නට පසුබට නොවෙමු.

මේ අධ්‍යාත්මික අන්ධබව නොවේ ද? පරිසිවරු හොඳ ජුදෙව්වෝ වූහ. ඔවුහු ජුදා ආගමික වත් පිළිවෙත් අකුරට ම පිළිපැද්දාහ. ඇත්ත වශයෙන් ම ඔවුහු ජේසුන් වහන්සේට විරුද්ධ වූයේත් ජුදා ආගම ආරක්ෂා කරගැනීමට යැයි සිතාගෙනය. එහෙත් ජේසුන් වහන්සේ ක්‍රිස්තියානි විශ්වාසය තුළ නීති රීති පිළිපැදීමට වඩා යමක් තිබෙන බව පෙන්වා දුන් සේක. ඒ බව පිළිගැනීමට පරිසිවරු අසමත් වූහ. අපටත් සිදුවී ඇත්තේ මේ දේමය. කිසියම් කෙනෙක් අපේ වරදක් පෙන්වා දෙනවාට අප අකමැතිය. ප්‍රශ්නයක දී අපට නොපෙනෙන පැත්තක් පෙන්වා දෙනවාට අප අකමැතිය.

කිතුනුවන්ගේ අධ්‍යාත්මික අන්ධකම පිළිඹිබු වන තවත් පැත්තක් නම් ශුද්ධවූ සභාවේ සමහර ඉගැන්වීම් පිළිබඳව ඔවුන්ගේ ප්‍රතිචාරයයි. කතෝලික සභාවේ ශීල ධාර්මික ඉගැන්වීම් (moral teachings)

ගැන මේ කරුණ ඉතා පැහැදිලිව දැකිය හැකිය. අද බොහෝ කතෝලිකයින් පවා සිතන්නේ ගබ්සාව, දික්කසාදය, සමලිංගික සේවනය, කෘත්‍රිම උපත් පාලනය, ගණිකා වෘත්තිය, ස්වයං වින්දනය, විවාහයෙන් පිට කායික සම්බන්ධතා ..... ආදියෙහි හරි වැරැද්ද පිළිබඳව තීරණය කිරීමට තරම් දැනුමක් සහ ප්‍රඥාවක් තම තමන්ට තිබෙන බවයි. මේ දේවල් ගැන තීරණ ගැනීමට සභාවේ මග පෙන්වීම අවශ්‍ය නැතැයි ඔවුහු සිතති. වසර දෙදහසක් තිස්සේ සභාව තුළ ශුද්ධාත්මයාණන් වහන්සේගේ අනුග්‍රහයෙන් ගොඩනැගුණු ප්‍රඥාවට වඩා උසස් ප්‍රඥාවක් තමන්ට ඇතැයි ඔවුහු සිතති. ජනවන්දනා වත් පිළිවෙත් සහ සමහර දේව ධාර්මික ඉගැන්වීම් අරභයා ද මේ තත්වය සුළු වශයෙන් හෝ දකින්නට ලැබේ. මේ තමන්ගේ දැනුමේ උඩඟුව නිසා උපන් අධ්‍යාත්මික අන්ධ බව නොවේද?



අධ්‍යාත්මික අන්ධබවින් සුවය ලබා ගන්නේ කෙසේද? සුවිශේෂයේ සඳහන් සුවය ලැබූ තැනැත්තා දෙස බලන්න. උපතින් ම අන්ධව සිටි ඔහුට වඩා වැඩියෙන් පරිසිවරු සහ අනෙක් ජුදෙව්වරු ක්‍රිස්තුන් වහන්සේ ගැන අසා දැක තිබූ බව නිසැක ය. එහෙත් ඔවුන්ට වඩා ඉක්මනින් ක්‍රිස්තුන් වහන්සේ ගැන අදහා ගන්නට අන්ධ මිනිසාට හැකියාව ලැබුණේ කොහොමද? **<u>ඒ සඳහා ඔහුට අවස්ථාව ලබා දුන්නේ ඒ වන තෙක් මහා අවාසනාවක් ලෙස සැළකූ ශාරීරික අන්ධ බවයි. එය ඔහුට තිබූ ලොකුම ප්‍රශ්නයයි. ලොකුම වේදනාවයි. එහෙම නම්, ඔබේ අධ්‍යාත්මික අන්ධ බව සුව කිරීමට ඉඩ සැලසෙන්නේ මේ මොහොතේ ඔබට ඇති විශාල ම ප්‍රශ්නය නිසා විය නොහැකිද?</u>** ඔබේ ප්‍රශ්නය ඔබව තමන් වහන්සේ වෙතට ළංකර ගැනීමට ක්‍රිස්තුන් වහන්සේ ලබා දුන් අවස්ථාවක් විය නොහැකිද?

ඔබ ඒ බව පිළිගන්නවා නම් ඊළඟට කළ යුත්තේ කුමක්ද? උන්වහන්සේට ඉඩ දෙන්න. සමහර විට උන්වහන්සේ ඔබට කරන්නට කියන දේ ඔබ අකමැති දෙයක් විය හැක. එහෙත් එය ඉටු කරන්න. මුහුණේ කෙළ තැවරීම ගැන සමහර විට අන්ධව සිටි තැනැත්තා අකමැති වන්නට ඇති. එහෙත් ඔහුගේ ජීවිත පරිවර්තනයට මාර්ගය වැටී තිබුණේ ඒ හරහා ය. *"සමිඳාණන් වහන්සේට ප්‍රිය මනාප දේ කුමක්දැ යි විමසා බලන්න"* කියා අද පාවුලු තුමා පවසයි. *"උන්වහන්සේ ඔබට කියන කවර දෙයක් වුවත් කරන්නැ"*යි යන දේව මාතාවන්ගේ වචනත් මතකයට නගා ගන්න.

***"සමිඳුනී, මගේ අන්ධබව කෙතරම් ද යත් මට නොපෙනෙන බව වත් මම නොදනිමි. හැම දෙයක් ම මට හොඳින් පෙනේ යැයි මම සිතාගෙන සිටිමි. මගේ ආත්මික ඇස් අවදිකර ඔබවහන්සේ ලෝකය අප දෙස බලන ආකාරයෙන් ලෝකය දෙස බලන්නට ඉගැන්වුව මැනව."***

*irudinasupuwatha@gmail.com*